

වාර්ෂික කාර්යසාධන වාර්තාව 2024

විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

© 2024 විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

විදේශ සම්පත් දෙපාර්තමේන්තුව
මහලේකම් කාර්යාලය (03 වන මහල)
තැ.පෙ. 277
කොළඹ 00100
ශ්‍රී ලංකාව

Info@erd.gov.lk
http://www.erd.gov.lk

අන්තර්ගතය

පිටු අංකය	
1	**පරිච්ඡේදය 01** ආයතනික පැතිකඩ
7	**පරිච්ඡේදය 02** ප්‍රගතිය හා ඉදිරි දැක්ම
19	**පරිච්ඡේදය 03** වසරේ සමස්ථ මූල්‍ය කාර්යසාධනය
27	**පරිච්ඡේදය 04** කාර්යසාධන දර්ශක
28	**පරිච්ඡේදය 05** තිරසාර සංවර්ධන අරමුණ (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය
30	**පරිච්ඡේදය 06** මානව සම්පත් පැතිකඩ
36	**පරිච්ඡේදය 07** අනුකූලතා වාර්තාව

පරිච්ඡේදය 01

ආයතනික පැතිකඩ

1.1. හැඳින්වීම

විදේශ සම්පත් දෙපාර්තමේන්තුව, විදේශ මූල්‍යයනය ඒකරාශී කිරීම පිළිබඳ වගකීම දරණ ප්‍රධානම රජයේ දෙපාර්තමේන්තුව වන අතර එය මුදල් අමාත්‍යාංශය යටතේ වන භාණ්ඩාගාර දෙපාර්තමේන්තු සහ අනෙකුත් රේඛීය අමාත්‍යාංශ සමඟ සම්බන්ධීකරණය ඇතිව ක්‍රියාත්මක වේ.

විදේශ සම්පත් දෙපාර්තමේන්තුව අධ්‍යක්ෂ ජනරාල් ප්‍රමුඛ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන් සිව්දෙනෙකු යටතේ පාලනය වේ. 2024 වසරේ දී අංශ ප්‍රධානීන් ලෙස කටයුතු කරන අධ්‍යක්ෂවරුන්ගේ අධීක්ෂණය යටතේ පහත සඳහන් අංශ හා ඒකක ක්‍රියාත්මක විය.

- ආසියානු සංවර්ධන බැංකු අංශය
- පෙරදිග ආසියානු අංශය
- ලෝක බැංකුව හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල් අංශය
- චීන හා ආසියානු යටිතල පහසුකම් හා අයෝජන බැංකු අංශය
- මැද පෙරදිග, දකුණු ආසියානු රටවල් හා එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන අංශය
- දියුණු ආර්ථික අංශය
- තාක්ෂණික ආධාර අංශය
- ප්‍රාග්ධන වෙළඳපොළ හා ආයෝජන අංශය
- ණය කළමනාකරණ අංශය
- අංශ සම්බන්ධීකරණ අංශය
- පාලන අංශය
- ගිණුම් අංශය
- තොරතුරු තාක්ෂණ ඒකකය

දැක්ම

ශ්‍රී ලංකාවේ තිරසර ආර්ථික සංවර්ධනය සඳහා සම්පත් ඒකරාශී කිරීම.

මෙහෙවර

ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනය සඳහා අවශ්‍ය වන පරිදි විශ්ව දැනුම, පරිචය, ප්‍රවීණතාවය හා දේශීය හා විදේශීය වෙළෙඳපොළෙන් සම්පත් සුදුසු කොන්දේසි යටතේ සපයා ගැනීම

අරමුණු

- සංවර්ධන අවශ්‍යතාවයන් සඳහා විදේශීය සම්පත් උචිත කොන්දේසි යටතේ ඒකරාශී කිරීම.
- දෙපාර්තමේන්තුව මඟින් මූලාශ්‍රය සපයන ලද සම්පත් වඩාත් හොඳින් උපයෝජනය කිරීම සඳහා විධායක හා ක්‍රියාත්මක ආයතනයන්ට පහසුකම් සැලසීම.
- වතෙර ධාරිතා සංවර්ධන පුහුණු අවස්ථා ඵලදායී අන්දමින් එක් රැස් කිරීම මඟින් රාජ්‍ය අංශයේ මානව සම්පත් සංවර්ධනය සඳහා දායකවීම.
- දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති වගකීම් සම්භාරය ඵලදායී මෙන්ම කාර්යක්ෂම ලෙස ඉටු කිරීම උදෙසා දෙපාර්තමේන්තුවේ හැකියාවන් සවිමත් කිරීම.

1.3. ප්‍රධාන කාර්යයන්

1. සංවර්ධන සහාය උපායමාර්ග හා ප්‍රමුඛතා හඳුනාගැනීමට සංවර්ධන පාර්ශ්වකරුවන් හා මූල්‍ය ආයතන සමඟ සාකච්ඡා පැවැත්වීම.

2. එක් එක් සංවර්ධන පාර්ශ්වකරුවන් වාර්ෂිකව ශ්‍රී ලංකා රජය වෙත ලබාදීමට නියමිත විදේශ මූල්‍යයන්ට අදාළ වැඩසටහන්වල ක්‍රියාකාරකම් රේඛීය අමාත්‍යාංශ/ ආයතන හා සමඟ සම්බන්ධීකරණය කිරීම.

3. රේඛීය අමාත්‍යාංශ/ ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව සමඟ එක්ව විදේශ මූල්‍යයනය සඳහා ව්‍යාපෘති පෙළගැස්මක් පිළියෙල කිරීම.

4. විදේශාධාර ලබාදෙන විදේශීය දූත කණ්ඩායම් වල ක්‍රියාකාරකම් තත්ත්ව ගවේෂී අදියරේ සිට ඇගයීම් අදියර දක්වා සම්බන්ධීකරණය කිරීම.

5. විදේශ ආධාර පිළිබඳ සම්මුති සාකච්ඡා පැවැත්වීම හා ණය/ ප්‍රදාන ගිවිසුම් අත්සන් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකිරීම සහ එම ගිවිසුම බලාත්මක කිරීම හා සම්බන්ධ පහත කාර්යයන් වල නිරත වීම.
   - සංවර්ධන පාර්ශ්වකරුවන් හා ණය දෙනු ලබන නියෝජිතායතන සමඟ සම්මුති සාකච්ඡා පැවැත්වීම;
   - ගිවිසුම් අත්සන් කිරීම සම්බන්ධයෙන් රජයේ අනුමැතිය හා අධිකාරි බලය ලබා ගැනීම
   - ක්‍රියාත්මක නියෝජිතායතන සමඟ උප ණය ගිවිසුම් අත්සන් කිරීම; සහ
   - ණය ගිවිසුම් බලාත්මක වීමට අවශ්‍ය පූර්ව කොන්දේසි සම්පූර්ණ කිරීම

6. විදේශීය ණය/ ප්‍රදාන මඟින් මූල්‍යයනය කරනු ලබන ව්‍යාපෘතීන්හි ක්‍රියාකාරිත්වය සොයා බැලීම සඳහා පහත ක්‍රියාකාරකම්වල නිරත වීම;
   - සංවර්ධන පාර්ශ්වකරුවන්ගේ සමාලෝචන දූත කණ්ඩායම්වල කටයුතු සම්බන්ධීකරණය හා නිර්දේශිත පසු විපරම් ක්‍රියාමාර්ග ගැනීම;

- විදේශීය මූල්‍යයනය මඟින් ක්‍රියාත්මක ව්‍යාපෘති අධීක්ෂණය සඳහා රේඛීය අමාත්‍යාංශ මඟින් පිහිටුවා ඇති මෙහෙයුම් කමිටු සඳහා සහභාගිවීම හා සංවර්ධන පාර්ශ්වකරුවන් සමඟ එකතුව ව්‍යාපෘති ක්‍රියාත්මකවීම පිළිබඳ ප්‍රගති සමාලෝචන කටයුතු සිදු කිරීම;

7 තාක්ෂණික සහයෝගිතා වැඩසටහන් යටතේ සංවර්ධන පාර්ශ්වකරුවන්ගෙන් ලැබෙන විදේශ පුහුණු අවස්ථා කළමනාකරණය කිරීම.


8 පහත සඳහන් ක්‍රියාකාරකම් මඟින් රජයේ විදේශ ණය කළමනාකරණය කිරීම සඳහා සහායදීම;

- පොදු රාජ්‍ය මණ්ඩලීය ණය සටහන් කිරීමේ හා ණය කළමනාකරණ පද්ධතිය (CS-DRMS) හරහා රජයේ විදේශ ණය කළඹ පිළිබඳ දත්ත පද්ධතිය පවත්වාගෙන යාම
  - ණය ගෙවීමේ කොන්දේසි සහ ගිවිසුම් පිළිබඳ අදාළ තොරතුරු ඇතුළත් කිරීම
  - ණය/ ප්‍රදාන එකඟතා, ප්‍රතිලබ්ධි, පොලී හා වාරික ගෙවීම්, විනිමය අනුපාතික, පොලී අනුපාත සහ අදාළ සාර්ව ආර්ථික දත්ත ඇතුළත් කිරීම
- නියමිත වේලාවට ගෙවීම් පියවීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ණය සේවාකරණ ගෙවීම් පිළිබඳ උපදෙස් ලබාදීම
- රාජ්‍ය මූල්‍ය කළමනාකරණය සහ අනෙකුත් තීරණ ගැනීමේ සහාය පිණිස විදේශ ණය සේවා පුරෝකථන දත්ත ලබාදීම
- ගිණුම්කරණය සහ ප්‍රකාශන සඳහා අදාළ ආයතන වෙත ණය දත්ත බෙදාහැරීම
- ලෝක බැංකුව හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත කාර්තුමය සහ වාර්ෂික පදනම්න් විදේශ ණය දත්ත වාර්තා කිරීම
- මහජන භාවිතය සඳහා සහ අනෙකුත් පාර්ශ්වකරුවන් සඳහා දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ විදේශ ණය පිළිබඳ තොරතුරු ප්‍රකාශයට පත් කිරීම
- දත්ත වල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා සංවර්ධන හවුල්කරුවන් සමඟ අවස්ථානෝචිතව ණය දත්ත ප්‍රතිසන්ධානය කිරීම

- අවශ්‍ය පරිදි ණය දත්ත විශ්ලේෂණය කිරීම

9	කාරක ප්‍රාග්ධන හා රටේ සංවර්ධන අවශ්‍යතා සඳහා දේශීය අරමුදල් සම්පාදනය.
10	විදේශීය වාණිජ ණය ගැනීමේ ගනුදෙනු ව්‍යුහගත කිරීම සහ ක්‍රියාත්මක කිරීම
11	තිරසාර ණය කළමනාකරණය සඳහා සහ හිතකර දේශගුණික ව්‍යාපෘති සඳහා අවශ්‍යකරන මූල්‍යකරණ පහසුකම් මූලාශ්‍රගත කිරීම සහ ව්‍යුහගත කිරීම - තිරසාර මූල්‍ය ප්‍රභවයන් හඳුනා ගැනීම සහ අවශ්‍යතා පදනම මත ව්‍යාපෘති ව්‍යුහගත කිරීම - හරිත මූල්‍යකරණය සඳහා ව්‍යාපෘති තෝරා ගැනීමට සහ ව්‍යුහගත කිරීමට පහසුකම් සැලසීම. - හරිත මූල්‍යකරණයට අදාළ නිකුත් කිරීමෙන් පසු ක්‍රියාවලිය, වාර්තා කිරීම සහ ඇගයීම යන කාර්යයන් කළමනාකරණය කිරීම සහ මෙහෙයවීම - තිරසාර දේශගුණික මූල්‍ය සම්පාදනයන් වැඩි දියුණු කිරීම සඳහා ජාතික, කලාපීය සහ ගෝලීය පාර්ශවකරුවන් සමඟ උපායමාර්ගික හවුල්කාරිත්වයන් ගොඩනැගීම - අදාළ පාර්ශ්වකරුවන් සමඟ සමීප සහයෝගීතාවයෙන් හරිත ව්‍යාපෘති පෙළගැස්ම සංවර්ධනයට සහාය වීම සහ පහසුකම් සැලසීම - ශ්‍රී ලංකා රජයෙහි හරිත මූල්‍යකරණ න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීම සඳහා වත්මන් මූල්‍ය පරතරය තක්සේරු කිරීම මත පදනම්ව ඵලදායී හරිත අරමුදල් සම්පාදනය සඳහා උපාය මාර්ග නිර්මාණය කිරීම, අඩු කාබන් සංවර්ධන දිශානතියක් කරා රට සංක්‍රමණය කිරීම සඳහා උත්ප්‍රේරක කාර්යභාරයක් ඉටු කිරීමට අදාළ පුද්ගලික මූල්‍ය ආකෘති වඩාත් ඵලදායී ලෙස බලමුලු ගැන්වීමට සහ කාබන් ණය පහසුකම් ලබා ගැනීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජය වෙත උපදෙස් ලබා දීම - අදාළ පාර්ශවකරුවන්ගේ ධාරිතා අවශ්‍යතා තක්සේරු කිරීම, උපාය මාර්ග සංවර්ධනය කිරීම සහ ධාරිතා සංවර්ධනය සිදු කිරීම
12	සියලු විදේශීය මූල්‍යයන ව්‍යාපෘතිවලට අදාළව, රජයේ වාර්ෂික අයවැය සකස් කිරීමේ ක්‍රියාවලියට පහසුකම් සැලසීම

1.4. ආයතන ව්‍යුහය



සංවර්ධන නිලධාරී - 23	
කළමනාකරණ සේවා නිලධාරී - 42	
ප්‍රාථමික ශ්‍රේණියේ නිලධාරී - 30	

අ.අ.ජ - අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
ස.අ. - සහකාර අධ්‍යක්ෂ

අ - අධ්‍යක්ෂ
පරි.නි. - පරිපාලන නිලධාරී

නි.අ - නියෝජ්‍ය අධ්‍යක්ෂ
තො.තා.නි. - තොරතුරු තාක්ෂණ නිලධාරී

පරිච්ඡේදය 02

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 හැඳින්වීම හා ඉදිරි දැක්ම

2024 වසරේදී ශ්‍රී ලංකාවේ ආර්ථිකය, වසර දෙකක් පුරා පවතින දැඩි ආර්ථික අවපත්ත්වයකින් පසු, ස්ථාවරත්වය සහ ශක්තිමත්භාවය පෙන්වා දුන්නා. 2022 මැද භාගයේ ආරම්භ කර ඇති සංශෝධන ක්‍රියාමාර්ග, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) විසින් මැද 2023 ආරම්භ කරන ලද වසර හතරක දිගු කළමනාකරණ දීර්ඝ අරමුදල් පහසුකම (EFF) මත පදනම්ව ක්‍රියාත්මක වූ අතර, එම ක්‍රියාමාර්ග වර්තමානයේදී ඵලදායී ප්‍රතිඵල ලබාදෙමින් පවතියි. ශ්‍රී ලංකාවේ ස්වාධීනත්වයට පසුව ඇතිවූ අභියෝගාත්මකතම ආර්ථික කාලසීමාවකදී ක්‍රියාත්මක කරන ලද මෙම සංශෝධන, ගැඹුරු ව්‍යුහමය දුර්වලතා සකස් කිරීම, මූලික ආර්ථික ස්ථාවරත්වය ප්‍රතිසංස්කරණය කිරීම, සහ දීර්ඝකාලීන මූල්‍ය සහ ණය සස්ථාවරභාවය විශ්වාසවන්ත කිරීම සඳහා යොමු විය. මෙයට අමතරව, ව්‍යුහගත සංශෝධන වැඩසටහන, ආධුනික පාලනය වර්ධනය කිරීම සහ තිරසාර ආර්ථික වර්ධනය උදෙසා දැඩි අවධානයක් යොමු කරයි.

2024 වසරේදී සිදුවූ බහුතර ගෙවීම් IMF සහ අන් අන්තර්ජාතික සංවර්ධන හවුල්කරුවන් මඟින් සිදු කරන ලදි. එසේම IMF-EFF යටතේ ඇමරිකානු ඩොලර් මිලියන 334 ක් ගෙවීම් ලැබුණි. I වැඩසටහනට සහය වඩාත් ශක්තිමත් කිරීම සඳහා, ආසියානු සංවර්ධන බැංකුව (ADB) සහ ලෝක බැංකුව (WB) 2024 වසර තුළදී සමස්තයෙන් ඇමරිකානු ඩොලර් මිලියන 1,427 ක් ගෙවා ඇත.

ද්විපාර්ශ්වික මාර්ගය හරහා, 2024 වසරේදී ජපානය, සවුදි අරාබි ආර්ථික සංවර්ධන අරමුදල, ජර්මනිය, නෙදර්ලන්තය, කොරියාව සහ ප්‍රංශය යන රටවල් වෙතින් ඇමරිකානු ඩොලර් මිලියන 68.6 ක විදේශ මුදල් ආධාරයක් ශ්‍රී ලංකාවට ලැබී ඇත. එමෙන්ම, 2024 වසරේදී ශ්‍රී ලංකා රජය විසින් සමස්තයෙන් ඇමරිකානු ඩොලර් මිලියන 1,918.2 ක විදේශ මූල්‍ය පහසුකම් ලබාගැනීමට හැකිවිය, එය රටේ ආර්ථික පුනරුත්ථාපන කටයුතු සඳහා වැදගත් සහාය විය.

2.2. ප්‍රගතිය - 2024

2.2.1. විදේශ මූල්‍යයන එකඟතා

ශ්‍රී ලංකා රජය විසින් 2024 ජනවාරි 1 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාල පරිච්ඡේදය තුළදී විවිධ විදේශ සංවර්ධන පාර්ශ්වකරුවන් හා ණය දෙන ආයතන සමඟ විදේශ මූල්‍යන එකඟතා ගිවිසුම් 19ක් මඟින් ඇ.ඩො. මිලියන 1,211.4 ක එකඟතා ඇතිකරගෙන ඇති අතර, එයින් ඩොලර් මිලියන 1,154.7 ක් ණය වශයෙන් ලබාගෙන ඇත. මෙම ණය අතරින් ඇ.ඩො. මිලියන 593 ක් හා ඇ.ඩො. මිලියන 511 ක් ලෙස පිළිවෙළින් ආසියානු සංවර්ධන බැංකුව හා ලෝක බැංකුව මඟින් ලබා ගෙන ඇත.

ණය ගිවිසුම් වලට අමතරව, 2024 වර්ෂයේදී ජපානය, ඔස්ට්‍රේලියාව, නෙදර්ලන්තය හා යුරෝපා සංගමය යන විදේශ සංවර්ධන ප්‍රදායකයින් සමඟ නිල සංවර්ධන ප්‍රදාන එකඟතා ගිවිසුම් 9ක් මඟින් ඇ.ඩො. මිලියන 56.7 ක එකඟතා ඇති කරගෙන ඇත.

රටේ පවතින වත්මන් ආර්ථික තත්වය යටතේ , සමස්ත මූල්‍යන එකඟතා වලින් ප්‍රතිශතයක් ලෙස 54 % ක් වන ඩොලර් මිලියන 658ක් අයවැය මූල්‍ය කරණය සඳහා භාවිතා කර ඇත.


මුළු එකඟතා	විදේශ ණය	විදේශ ප්‍රදාන
ඇ.ඒ.ජ.ඩො.මිලියන	*ඇ.ඒ.ජ.ඩො.මිලියන*	*ඇ.ඒ.ජ.ඩො.මිලියන*
1,211.4	1,154.7	56.7

විදේශ මූල්‍යයන එකඟතා 2024, සංවර්ධන පාර්ශ්වකරු අනුව

සංවර්ධන පාර්ශ්වකරු	වටිනාකම (ඇ.ඒ.ජ.ඩො. මිලියන)		
	ණය	ප්‍රදාන	එකතුව
ද්විපාර්ශ්වීය	**-**	**54.5**	**54.5**
ජපානය	-	27.8	27.8
ඇමරිකා එක්සත් ජනපදය	-	20.9	20.9
කොරියාව	-	5.8	5.8
බහුපාර්ශ්වීය	**1,154.7**	**2.2**	**1,156.9**
ජාත්‍යන්තර මූල්‍ය අරමුදල	593.0	-	593.0
ලෝක බැංකුවේ ජාත්‍යන්තර සංවර්ධන සමායතනය	511.7	-	511.7
ආසියානු සංවර්ධන බැංකුව	50.0	-	50.0
යුරෝපා සංගමය	-	2.2	2.2
එකතුව	**1,154.7**	**56.7**	**1,211.4**


මූලාශ්‍රය : විදේශ සම්පත් දෙපාර්තමේන්තුව
සටහන : එක් එක් විදේශ විනිමයයෙන් සටහන් වන එකඟතා අගයයන් ඇ.ඒ.ජ.ඩො. හා රුපියල් බවට හැරවීමේදී අදාළ ගිවිසුම් අත්සන් කරන ලද දිනයේ පැවති විනිමය අනුපාතිකයන් භාවිතා කර ඇත.
විශේෂ ගැණුම් හිමිකම් විනිමය ඇ.ඒ.ජ. ඩො. හා රුපියල් බවට හැරවීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශයට පත්කරන ලද පෙර මාසයේ අවසානයේ පැවති මාසික විනිමය අනුපාතිකයන් භාවිතා කර ඇත.

විදේශ මූල්‍යයන එකඟතා 2024, ප්‍රධාන සංවර්ධන පාර්ශ්වකරු / ණය දෙන ආයතනය අනුව (ඇ.ඒ.ජ.ඩො.මිලියන)



මූලාශ්‍රය : විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

විදේශ මූල්‍යයන එකඟතා 2024, ප්‍රධාන ආර්ථික අංශ අනුව (ඇ.ඒ.ජ.ඩො.මිලියන)



**වෙනත්- අධ්‍යාපන හා පුහුණු, ධීවර, සංචාරක හා හෝටල් කර්මාන්ත*

2024 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා ඇතිකර ගත් නිල සංවර්ධන සහයෝගිතා, අයවැය මූල්‍යකරණය හා ප්‍රතිපත්ති ණය අදාළ මූල්‍ය කොන්දේසි සමඟ

සංවර්ධන පාර්ශ්වකරු/ ණය දෙන ආයතනය	ණය හෝ ප්‍රදානය	වචනාවලිය ගිවිසුම් අත්සන් කරන ලද දිනය (දිනය/මාසය/වර්ෂය)	ව්‍යාපෘතිය වැඩසටහන හෝ ණය	එකඟතා ප්‍රමාණය (මිලියන)				මූල්‍ය කොන්දේසි				වෙනත් කොන්දේසි	
				ඩිනොමය	අත්සන් කරන ලද ඩිනොමයෙන්	රූපියල්	ඇ.ඩ.ජ. ඩොලර්	පොළිය			වෙනත් ගාස්තු	සහන කාලය	ආපසු ගෙවීම් කාලය/ පරිණත කාලය (ගිවිසුම්ගත දිනයේ සිට(වර්ෂ)
								වර්ගය	වාර්ෂික අනුපාතය (සියයට)	සීමාන්තිකය (පදනම් අංක සියයට)			
ද්විපාර්ශ්වික													
ඕස්ට්‍රේලියව	ප්‍රදාන	30/01/2024	සංවර්ධනය සඳහා යහපාලනය	ඇ. ඩො.	30.0	6,307.2	19.8	අදාළ නොවේ					3
	ප්‍රදාන	30/01/2024	වෙළඳපල සංවර්ධන පහසුකම් වැඩසටහනේ අදියර 2	ඇ. ඩො.	12.1	2,543.9	8.0	අදාළ නොවේ					3
ජපානය	ප්‍රදාන	14/02/2024	ශ්‍රී ලංකාවේ රෝහල්වල පුනර්ජනනීය බලශක්තිය භාවිතයෙන් විදුලිබල සැපයුම ස්ථාවර කිරීමේ ව්‍යාපෘතිය	යෙන්	1,230.0	2,560.6	8.2	අදාළ නොවේ					3
	ප්‍රදාන	18/03/2024	උතුරු පළාතේ ප්‍රධාන රෝහල්වල මාතෘ සහ ළමා සත්කාර සඳහා ආධාරක උපකරණ	යෙන්	404.0	827.2	2.7	අදාළ නොවේ					3
	ප්‍රදාන	18/03/2024	ශ්‍රී ලංකා වෙරළාරක්ෂක බලකායේ තෙල් කාන්දු ප්‍රතිචාර දැක්වීම සහ කළමනාකරණය වැඩිදියුණු කිරීම.	යෙන්	1,000.0	2047.6	6.7	අදාළ නොවේ					1

	ප්‍රදාන	18/03/2024	උතුරු සහ නැගෙනහිර පළාත්වල ධීවරයින්ගේ ආරක්ෂාව සඳහා ආධාරක උපකරණ	යෙන්	200.0	409.5	1.3	අදාළ නොවේ	3
	ප්‍රදාන	19/07/2024	මානව සම්පත් සංවර්ධන ශිෂ්‍යත්ව ව්‍යාපෘතිය	යෙන්	304.0	587.1	1.9	අදාළ නොවේ	7
නෙදර්ලන්තය	ප්‍රදාන	14/03/2024	නෙදර්ලන්තයේ මූල්‍ය ආධාර යටතේ ග්‍රාමීය පාලම් ඉදිකිරීම (වැඩිදියුණු කිරීම)	යූරෝ	5.3	1,787.0	5.8	අදාළ නොවේ	7
බහුපාර්ශ්වීය									

ආසියා සංවර්ධන බැංකුව	ණය	25/03/2024	කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් වැඩිදියුණු කිරීමේ මූල්‍ය ව්‍යාපෘතිය	ඇ.ඩො.	100.0	30,354.9	100.0	ස්ථාවර	2	අදාළ නොවේ	අදාළ නොවේ	5	25
	ණය	5/8/2024	විදුලිබල අංශ ප්‍රතිසංස්කරණ සහ මූල්‍ය තිරසාරභාවය පිළිබඳ වැඩසටහන (උප වැඩසටහන 1	ඇ.ඩො.	100.0	30,208.9	100.0	ස්ථාවර	2	අදාළ නොවේ	අදාළ නොවේ	5	25
	ණය	20/09/2024	ජල සම්පාදන හා සනීපාරක්ෂක ප්‍රතිසංස්කරණ වැඩසටහන - උප වැඩසටහන 1	ඇ.ඩො.	100.0	30,455.0	100.0	ස්ථාවර	2	අදාළ නොවේ	අදාළ නොවේ	5	25

	ණය	20/09/2024	මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන - 3 වන අදියර	ඇ.ඩො.	93.0	28,323.2	93.0	විචල්‍ය	SOFR	0.7	පොරොන්දු ගාස්තු 0.15%	8	29
	ණය	27/11/2024	මූල්‍ය අංශයේ ස්ථාවරත්වය සහ ප්‍රතිසංස්කරණ - උප වැඩසටහන 2	ඇ.ඩො.	200.0	58,229.4	200.0	ස්ථාවර	2	අදාළ නොවේ	අදාළ නොවේ	5	25
යුරෝපා සංගමය	ප්‍රදාන	12/8/2024	සමාජ සහජීවනය සහ සාමය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය වැඩිදියුණු කිරීම (SCOPE)	යූරෝ	2.0	656.2	2.2	අදාළ නොවේ					5
ජාත්‍යන්තර සංවර්ධන සමායතනය	ණය	31/01/2024	මූල්‍ය අංශයේ ආරක්ෂක ජාල ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය	SDR වි.ගැ.හි	112.8	47,614.7	150.0	ස්ථාවර	1.25	අදාළ නොවේ	පොරොන්දු ගාස්තු 0.5% සේවා ගාස්තු 0.75%	5	30
	ණය	10/9/2024	ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය	SDR වි.ගැ.හි	38.0	15,368.1	51.2	ස්ථාවර	1.25	අදාළ නොවේ	පොරොන්දු ගාස්තු 0.5%	5	30

											සේවා ගාස්තු 0.75%		
	ණය	7/10/2024	දෙවන ප්‍රකෘෂ්ඨ සථාවර හා ආර්ථික හැරවුම් සංවර්ධන ප්‍රතිපත්ති මෙහෙයුම් වැඩසටහන	SDR වි.ගැ.හි	150.6	61,149.4	208.1	ස්ථාවර	1.25	අදාළ නොවේ	පොරොන්දු ගාස්තු 0.5% සේවා ගාස්තු 0.75%	5	30
ප්‍රතිසංස්කරණය සහ සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුව	ණය	10/9/2024	ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (ණය B- SM1)	SDR වි.ගැ.හි	75.9	30,695.8	102.3				පොරොන්දු ගාස්තු 0.5%	6	12
ඔපෙක් සංවිධානය	ණය	19/12/2024	දෙවන ප්‍රකෘෂ්ඨ සථාවර හා ආර්ථික හැරවුම් සංවර්ධන ප්‍රතිපත්ති මෙහෙයුම් වැඩසටහන	ඇ.ඩො.	50.0	14,564.1	50.0	ස්ථාවර			2.5	අදාළ නොවේ	පොරොන්දු ගාස්තු 0.25%
එකතුව						**681,303.0**	**2,120.5**						

මූලාශ්‍රය : විදේශ සම්පත් දෙපාර්තමේන්තුව
සටහන : SOFR = Secured Overnight Financing Rate
විදේශ විනිමයෙන් සටහන් වන එකඟතා අගයයන් ඇ.එ.ජ.ඩොලර් හා රුපියල් බවට හැරවීමේ දී අදාළ ගිවිසුම් අත්සන් කරන ලද දිනයේ පැවති විනිමය අනුපාතිකයන් භාවිත කර ඇත.
විශේෂ ගැනුම් හිමිකම් විනිමය ඇ.එ.ජ.ඩොලර් හා රුපියල් බවට හැරවීම සඳහා, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කරන ලද පෙර මාසයේ අවසානයේ පැවති මාසික විනිමය අනුපාතිකයන් භාවිතා කර ඇත.

2.2.2. විදේශ මූල්‍යයන ප්‍රතිලබ්ධි හා උපයෝජනය

2024 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා, සංවර්ධන ව්‍යාපෘතිවල උපයෝජනය පිණිස ලද මුළු විදේශ ප්‍රතිලබ්ධි ප්‍රමාණය ඇ.ඒ.ජ.ඩොලර් මිලියන 1915.8 කි. එම ප්‍රතිලබ්ධි ප්‍රමාණයෙන් ඇ.ඒ.ජ.ඩොලර් මිලියන 1887.7 ක් ණය ගිවිසුම් අනුව සිදුවූ ප්‍රතිලබ්ධි වන අතර, ඇ.ඒ.ජ.ඩොලර් මිලියන 28.1 ක් පූර්ණ ප්‍රදාන ලෙස ලද ප්‍රතිලබ්ධි විය.

2023 වර්ෂය තුළ ලද මෙම ප්‍රතිලබ්ධිවලින් ඉහළම ප්‍රමාණය ආසියානු සංවර්ධන බැංකුව සමග අත්සන් කරන ලද ණය ගිවිසුම් අනුව ලබා ගත් අතර, එය සමස්තයෙන් ආසන්න වශයෙන් සියයට 45ක් ද අනතුරුව ඉහළම ප්‍රමාණයක් ලෝක බැංකුව (සියයට 30) සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (සියයට 17) සමග අත්සන් කරන ලද ගිවිසුම් අනුව සිදුවූ ප්‍රතිලබ්ධි වේ.

2024 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා විදේශ මූල්‍යයන ප්‍රතිලබ්ධි, සංවර්ධන පාර්ශ්වකරු අනුව


සංවර්ධන පාර්ශ්වකරු / ණය දෙන ආයතනය	උපලබ්ධි ප්‍රමාණය* (ඇ.ඒ.ජ.ඩො. මිලියන)		
	ණය	ප්‍රදාන	එකතුව
ද්විපාර්ශ්වීය	**61.5**	**7.1**	**68.6**
ඉන්දියාව	35.3	2.0	37.3
ජපානය	19.0	-	19.0
නෙදර්ලන්තය	-	4.6	4.6
සෞදි අරමුදල	2.9	-	2.9
ජර්මනිය	4.3	-	4.3
ප්‍රංශය	-	0.44	0.44
බහුපාර්ශ්වීය	**1,828.2**	**21.5**	**1,849.7**
ආසියානු සංවර්ධන බැංකුව	859.8	2.3	862.1
ලෝක බැංකුව	545.7	19.2	564.9
ජාත්‍යන්තර මූල්‍ය අරමුදල	334.0	-	334.0
ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව	51.9	-	51.9
ඔපෙක් අරමුදල	20.3	-	20.3
කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල	16.4	-	16.4
එකතුව	**1,889.7**	**28.5**	**1,918.2**

මූලාශ්‍රය : විදේශ සම්පත් දෙපාර්තමේන්තුව
සටහන : එක් එක් විදේශ විනිමයයෙන් සටහන් වල ප්‍රතිලබ්ධි අගයයන් ඇ.ඒ.ජ.ඩො. හා රුපියල් බවට හැරවීමේදී එක් එක් ප්‍රතිලබ්ධීන් සිදුවූ දිනයන්හි පැවති විනිමය අනුපාතිකයන් භාවිතා කර ඇත.
** තාවකාලික අගයයන්*


මෙම වර්ෂයේ සිදුවූ ප්‍රතිලබ්ධිවලින් සියයට 49 කට ආසන්න ප්‍රමාණයක් අයවැය මූල්‍යකරණය සඳහා යොදවා ඇති අතර, අනතුරුව සියයට 8 ක් වන ප්‍රමාණයක් ජල සම්පාදන හා සනීපාරක්ෂක අංශයේ ව්‍යාපෘතිවල ද, සියයට 5 බැගින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සංවර්ධන අංශයට සහ මූල්‍ය අංශයට යොදවා ඇත.

2024 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා ප්‍රතිලබ්ධීන්

ප්‍රතිලබ්ධීන් 2024, සංවර්ධන පාර්ශ්වකරු/ ණය දෙන ආයතනය අනුව *(ඇ.ඒ.ජ.ඩො. මිලියන)*



ප්‍රතිලබ්ධීන් 2024, ප්‍රධාන ආර්ථික අංශ අනුව *(ඇ.ඒ.ජ.ඩො. මිලියන)*



මූලාශ්‍රය : විදේශ සම්පත් දෙපාර්තමේන්තුව
** වෙනත් - කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල, සෞදි අරමුදල, ජර්මනිය, ප්‍රංශය*
*** වෙනත් - නිවාස සහ නාගරික සංවර්ධන, ග්‍රාමීය සංවර්ධනය, මානුෂීය ආධාර, විදුලිය සහ බලශක්ති, විද්‍යා සහ තාක්ෂණය, ආරක්ෂක, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්ව සංවර්ධන, ඉඩම් සංවර්ධනය, පරිසරය, ආපදා කළමනාකරණය, වැවිලි, යුක්තිය සහ පාලනය*

2.2.3. චකඟතා පළකරන ලදුව ඉදිරියේදී උපයෝජනය වීමට නියමිත ශේෂය


දැනට පළ කර ඇති චකඟතා අනුව විවිධ සංවර්ධන ව්‍යාපෘති හා වැඩසටහන්වල උපයෝජනය වීමට නියමිත විදේශ මූල්‍යයනවල ශේෂය 2024 දෙසැම්බර් 31 දින වනවිට ඇ.ඒ.ජ.ඩොලර් බිලියන 5.1 ක් විය. මෙයින් ඉහළම ප්‍රමාණය චීනය (24%) විසින් ලබා දීමට නියමිත අතර, අනතුරුව ඉහළ ප්‍රමාණයන් පිළිවෙලින් ඉන්දියාව (17%), ජපානය (16%), ලෝක බැංකුව (13%) සහ ආසියානු සංවර්ධන බැංකුව (10%) විසින් ලබා දීමට නියමිතය.

චකඟතා පළකරන ලදුව ඉදිරියේ දී උපයෝජනය වීමට නියමිත විදේශ මූල්‍යයන ශේෂයෙන් සියයට 23.8 ක ප්‍රමාණයක් මාර්ග හා පාලම් අංශයේ ද, සියයට 15.2ක ප්‍රමාණයක් ජල සම්පාදනය හා සනීපාරක්ෂාව අංශයේ ද, සියයට 11 ක ප්‍රමාණයක් ප්‍රවාහන අංශයේ ද චකඟතා පළ කරන ලද ව්‍යාපෘතිවල උපයෝජනය වීමට නියමිතය.

2024 දෙසැම්බර් 31 වන විට පළකරන ලද එකඟතා අනුව ප්‍රතිලබ්ධිවීමට නියමිත ශේෂය - ප්‍රධාන ආර්ථික අංශ අනුව

ප්‍රධාන ආර්ථික අංශය	එකඟතා පළකරන ලදුව ඉදිරියේදී උපයෝජනයවීමට නියමිත ශේෂය* (ඇ.ඒ.ඩො.මිලියන)
මාර්ග හා පාලම්	1,219
ජල සම්පාදනය හා සනීපාරක්ෂාව	777
ප්‍රවාහනය	566
වෙළෙඳ	529
අධ්‍යාපනය හා පුහුණුව	333
සෞඛ්‍යය හා සමාජ සුභසාධනය	282
විදුලිබල හා බලශක්ති	201
වාරිමාර්ගසහ ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම්	196
**වෙනත්	1,015
එකතුව	**5,118**


2024 දෙසැම්බර් 31 වන විට පළ කරන ලද එකඟතා අනුව ප්‍රතිලබ්ධි වීමට නියමිත ශේෂය එක් එක් සංවර්ධන පාර්ශ්වකරු අනුව (ඇ.ඒ.ජ.ඩො.මිලියන)



2.2.4 විදේශ ණය ප්‍රමාණය හා විදේශ ණය සේවාකරණය

2024 දෙසැම්බර් 31 වන විට රජය විසින් ලබාගත් විදේශ ණය මූල්‍යයනයන් සඳහා ආපසු ගෙවීමට එකතු වී තිබූ විදේශ ණය ප්‍රමාණය ඇ.ඩො.ජ.ඩොලර් බිලියන 36.68 කි. ණය දෙන ආයතන කාණ්ඩය අනුව විදේශ ණය සංයුතිය රූපසටහන 6.6 හි දැක්වේ.

2024 දෙසැම්බර් 31 දින වනවිට මධ්‍යම රජයේ විදේශ ණය ප්‍රමාණය (ඇ.ඩො.ජ.ඩො. මිලියන)



මූලාශ්‍රය : විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර නිකුත් කිරීම් සහ කාලීන ණය පහසුකම් ඇතුළත් වාණිජ ණය මධ්‍යම රජයේ මුළු විදේශ ණයවලින් සියයට 36 ක ප්‍රමාණයක් නියෝජනය කරන අතර, ඉතිරිය පිළිවෙලින් බහුපාර්ශ්වික ණය සියයට 35 සහ ද්විපාර්ශ්වික ණය සියයට 29 මඟින් නියෝජනය වේ. වාණිජ කාණ්ඩයේ ණයෙන් සියයට 81 ක් පමණ ජාත්‍යන්තර බැඳුම්කර නිකුත් කිරීම් (ISB) වලින් සමන්විත වූ අතර ඉතිරිය කාලීන මූල්‍ය පහසුකම් (සින්ඩිකේටඩ් ණය) වලින් සමන්විත විය.

තවද, 2024 ජනවාරි 1 සිට දෙසැම්බර් 31 දක්වා සිදු කරන ලද ණය සේවාකරණය ඇ.ඩො.ජ.ඩොලර් මිලියන 1,673.6 කි. මෙයින්, ඇ.ඩො.ජ.ඩොලර් මිලියන 924.8 ක් ණය වාරික ආපසු ගෙවීම සඳහා යොදවා ඇති අතර, ඉතිරිය වන ඇ.ඩො.ජ.ඩොලර් මිලියන 748.8 ක ප්‍රමාණය පොලී ගෙවීම සඳහා යොදවා ඇත.
රජය විසින් අනුගමනය කරන ලද ණය ගෙවීම තාවකාලිකව අත්හිටුවීමේ අතුරු ප්‍රතිපත්තියට අනුකූලව, බලපෑමට ලක් වූ ද්විපාර්ශ්වික සහ වාණිජ ණයහිමියන්ගේ විදේශ ණය සේවාකරණය 2022 අප්‍රේල් 12 වන දින සිට ආරම්භ වන පරිදි අන්තර්කාලීනව තාවකාලිකව අත්හිටුවන ලදී. ඒ අනුව, දෙසැම්බර් 31 දින දක්වා නොගෙවා ඇති ණය වාරික ප්‍රමාණය ඇ.ඩො.ජ.ඩොලර් මිලියන 1,639.5 ක්ද, පොලී ප්‍රමාණය ඇ.ඩො.ජ.ඩොලර් මිලියන 390.11 ක් ද විය. මෙම නොගෙවූ ණය පිළිබඳව ඉදිරියේදී පැවැත්වීමට නියමිත ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියේදී අදාළ ණයහිමියන් සමඟ සාකච්ඡා කිරීමට රජය විසින් පියවර ගනු ඇත.

සහතික කළේ:

නම: සමන්ත බණ්ඩාර

තනතුර: අධ්‍යක්ෂ ජනරාල්, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

අත්සන:

ආර්.එම්.එස්.පී.එස්. බණ්ඩාර
අධ්‍යක්ෂ ජනරාල්
විදේශ සම්පත් දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01.

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1. මූලික කාර්යසාධන ප්‍රකාශනය

එස්සීඒ-එෆ්

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය		සටහන	රුපියල්		
			තත්‍ය		
			2024	2023	
-	**ආදායම් ලැබීම්**		-	-	
	ආදායම් බදු				
-		1	-	-	
	දේශීය භාණ්ඩ හා සේවා මත බදු				
-		2	-	-	එස්සීඒ -1
	ජාත්‍යන්තර වෙළඳාම මත බදු				
-		3	-	-	
	බදු නොවන ආදායම් හා වෙනත්				
-		4	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**		-	-	
	භාණ්ඩාගාර අග්‍රිම		2,735,331,085	1,667,441,195	
-					එස්සීඒ -3
	තැන්පතු		889,227	383,084	
-					එස්සීඒ -4
	අත්තිකාරම් ගිණුම්		7,236,551	7,213,293	එස්සීඒ - 5/5(a)/5(b)
-					
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		639,030,567	721,919,011	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**3,382,487,430**	**2,396,956,583**	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් (ඇ) = (අ) + (ආ)**		**3,382,487,430**	**2,396,956,583**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		4,892,698	342,557	

	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් (ඉ) - (ඈ) - (ඌ)		**3,377,594,732**	**2,396,614,026**	
	අඩු කළා : වියදම් පුනරාවර්තන වියදම්		**-**	-	
-					
128,811,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	117,413,304	106,173,058	
77,645,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	58,923,901	68,273,992	**ඒසීඒ -2(ii)**
244,530,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	118,678,256	128,703,065	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
450,986,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**295,015,461**	**303,150,115**	
	මූලධන වියදම්				
600,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	126,588	227,978	
144,900,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	17,931,590	4,757,216	
2,756,200,000	ප්‍රාග්ධන මාරුකිරීම්	12	2,419,468,761	1,365,563,607	**ඒසීඒ -2(ii)**
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13		-	
640,030,567	හැකියා වර්ධනය	14	639,598,375	722,002,511	
-	වෙනත් මූලධන වියදම්	15		-	
3,541,730,567	**මුළු මූලධන වියදම් (උ)**		**3,077,125,314**	**2,092,551,312**	
	තැන්පතු ගෙවීම්		889,227	383,084	**ඒසීඒ -4**
	අත්තිකාරම් ගෙවීම්		10,063,519	6,313,401	**ඒසීඒ -5**
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**10,952,746**	**6,696,485**	
	මුළු වියදම් (එ) - (ඊ+උ+ඌ)		3,383,093,521	2,402,397,912	
	දෙසැම්බර් 31 දිනට ශේෂය (ඒ) = (ඉ) – (එ)		**(5,498,789)**	**(5,783,886)**	
	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		(5,498,789)	(5,783,886)	**ඒසීඒ-7**
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය				**ඒසීඒ-3**
			(5,498,789)	**(5,783,886)**	

3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒඑසිඒ-පී

2024 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	කප්‍යා 2024 රු.	2023 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒඑසිඒ-6	188,797,849	173,935,794
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒඑසිඒ-5/5(ඒ)	20,378,907	17,551,939
මුදල් හා මුදල් සමාන දෑ	ඒඑසිඒ-3	-	-
මුළු වත්කම්		**209,176,756**	**191,487,733**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		20,378,907	17,551,939
දේපළ පිරියත හා උපකරණ සංචිතය		188,797,849	173,935,794
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒඑසිඒ-5(බී)		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒඑසිඒ-4	-	-
අග්‍රිම ශේෂය	ඒඑසිඒ-3	-	-
මුළු වගකීම්		**209,176,756**	**191,487,733**

පිටු අංක 07.සිට 31 දක්වා ඒඑසිඒ 1 සිට ඒඑසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 32 සිට 38. දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. **මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 විධිවිධානයන්ට අනුකූලව** සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	සහකාර අධ්‍යක්ෂ (මුදල්)
නම : කේ.එම් මහින්ද සිරිවර්ධන	නම : ආර් එම් එස්.පී.එස් බණ්ඩාර	නම : ජී.ජී.ඩී .මධුරංගන
තනතුර : ලේකම්	තනතුර : අධ්‍යක්ෂ ජනරාල්	දිනය : 2025.02.20
දිනය : 2025.02.27	දිනය : 2025.02.20	
කේ.එම්.මහින්ද සිරිවර්ධන මහා භාණ්ඩ... ආර්...	ආර්.එම්.එස්.පී.එස්. බණ්ඩාර අධ්‍යක්ෂ ජනරාල් විදේශ සම්පත් දෙපාර්තමේන්තුව මහා භාණ්ඩාගාරය කොළඹ 01.	ජී.ජී.ඩී. මධුරංගන සහකාර අධ්‍යක්ෂ (මුදල්) (වැ.ඛ.) විදේශ සම්පත් දෙපාර්තමේන්තුව මහා භාණ්ඩාගාරය කොළඹ 01.

3.3. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

එස්එල් -සී

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	තත්ය	
	2024	2023
	රු.	රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
ආදායම් නොවන ලැබීම්		-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	889,227	383,084
අග්‍රිම ලැබීම්	6,985,490	7,501,673
අත්තිකාරම් අයකර ගැනීම්	662,445	553,031
තැන්පත් ලැබීම්	644,688,888	728,952,196
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	2,735,331,085	1,667,441,195
අඩුකළා : මුදල් වැය කිරීම්	**3,388,557,135**	**2,404,831,179**
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	176,336,125	174,173,231
සහනාධාර සහ මාරුකිරීම්	118,678,256	129,003,065
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	571,996	2,308,905
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	4,892,698	342,557
අත්තිකාරම් ගෙවීම්	10,063,519	6,069,025
තැන්පතු ගෙවීම්	889,227	383,084
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**311,431,821**	**312,279,867**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය(අ)-(අ)-(ආ)	**3,077,125,314**	**2,092,551,312**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොලී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
	-	-

උප ණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)		
අඩුකළා : මුදල් වැය කිරීම්		
මූලධන වියදම්	3,077,125,314	2,092,551,312
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**3,077,125,314**	**2,092,551,312**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)-(අ)-(ඉ)	**(3,077,125,314)**	**(2,092,551,312)**
	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්	-	-
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (උ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්	-	-
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඒ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)-(උ)-(ඒ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) - (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය		
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය		

3.4. මූල්‍ය ප්‍රකාශ සටහන්

වාර්තා කිරීමේ පදනම

1) වාර්තාකරණ කාලපරිච්ඡේදය

2024 ජනවාරි **01** සිට දෙසැම්බර් **31** දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදයන් වේ.

2) මිණුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර, සමහර වත්කම්වල ඓතිහාසික පිරිවැය නැවත නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩිදියුණු කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කලළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල් වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) ආදායම් හඳුනා ගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාල පරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනා ගනු ලැබේ.

4) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගෙන ඇත.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවල දී නැවත තක්සේරු කරන ලද අගය යොදා ගනී.

5) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6) මුදල් හා මුදල් සමාන දෑ

2024 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

3.5. ආදායම් එකතු කිරීමෙන් කාර්යසාධනය

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුදල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
අදාළ නොවේ					

3.6. වෙන්කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ ප්‍රතිපාදන

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදන		
පුනරාවර්තන	443,995,000	450,986,000	295,015,461	65%
ප්‍රාග්ධන	3,541,700,000	3,541,730,567	3,077,125,314	86%

3.7. මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ /දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට /දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
අදාළ නොවේ						

3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2024 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2024 දිනට මූල්‍ය තත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී හිඟුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9152	යන්ත්‍රෝපකරණ	148,560,140.01			
9154	අස්පෘශ වත්කම්	24,337,708.64			
9180	බදු දෙන ලද වත්කම්	15,900,000.00			

3.9. විගණකාධිපතිවරයාගේ වාර්තාව **

** විගණකාධිපති විසින් නිකුත් කරනු ලබන 2024 දෙසැම්බර් 31 වන දිනට නියමිත අවසන් විගණන වාර්තාව ඇමුණුම 01 හි අමුණා ඇත.

කාර්යසාධන දර්ශක

4.1 ආයතනයේ කාර්යසාධන දර්ශකය ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව

විශ්ලේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100% - 90%	75% - 89%	50% - 74%
මූල්‍ය ඵකඟතා		78	
මූල්‍ය උපයෝජන	109		
තාක්ෂණික පුහුණු අවස්ථාවන් (නිලධාරීන් ගණන)	113		

තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්යසාධනය (SDG)

5.1. හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න

ඉලක්කය / අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%-100%
රටවල් තුළ සහ ඒවා අතර අසමානතාවය අඩුකිරීම	ඇ.ඩී.ජ.ඩොලර් මිලියන 644	ප්‍රතිලාභී හෝ දායක රට සැපයුම් මාදිලිය (නිල සංවර්ධන ආධාර, සෘජු විදෙස් ආයෝජන හෝ වෙනත් සැපයුම්) අනුව සංවර්ධනය සඳහා වන සමස්ත සම්පත් ගලනය ලද ප්‍රමාණය: ඇ.ඩී.ජ.ඩොලර් මිලියන : *454*			82
සවිමත් යටිතල පහසුකම් ගොඩනැඟීම, පරිපූර්ණ සහ තිරසර කාර්මීකරණ ප්‍රවර්ධනය කර නව්‍යකරණය දිරිගැන්වීම	ඇ.ඩී.ජ.ඩොලර් මිලියන 891	යටිතල පහසුකම් සඳහා වන සමස්ත නිල ජාත්‍යන්තර සහාය (නිල සංවර්ධන ආධාර සහ වෙනත් නිල වශයෙන් ලැබෙන සැපයුම්) ලද ප්‍රමාණය: ඇ.ඩී.ජ.ඩොලර් මිලියන *:385*		74	
පරිපූර්ණ සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම	1,500	ක්ෂේත්‍රය සහ ඉගෙනුම් ආකාරය අනුව, ශිෂ්‍යත්ව සඳහා නිල සංවර්ධන ආධාර ගලා යාමේ ප්‍රමාණය ලැබුණු අවස්ථා ගණන : (1701)			113

5.2. තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න

සංවර්ධන පාර්ශ්වකරුවන් විසින් වාර්ෂික විදේශ අරමුදල් ලබාදීම සිදුකරන අතර එය මුළු එකඟතා ලෙස සටහන් කර ගනී. රේඛීය අමාත්‍යාංශ මඟින් කෘෂි කර්මාන්තය, වාරිමාර්ග, නිපුණතා සංවර්ධන, අධ්‍යාපනය, දරිද්‍රතාව පිටුදැකීම, මාර්ග හා මහාමාර්ග, නාගරික සංවර්ධන හා සෞඛ්‍යය වැනි විවිධ අංශයන්හි විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා මෙම එකඟ වූ අරමුදල් උපයෝජනය කරනු ලැබේ.

කෙසේ වෙතත්, පරිසර නිෂ්කාශනය, ඉඩම් අත්පත්කර ගැනීම, උපයෝගිතා සේවාවන් ප්‍රතිස්ථාපනය කිරීම, නැවත ස්ථානගත කිරීම හා නැවත පදිංචි කිරීම, තක්සේරු කිරීම හා ප්‍රසම්පාදනය වැනි ව්‍යාපෘති සූදානමට සම්බන්ධ ගැටළු හේතුවෙන් උපයෝජනයන් සැලසුම් කළ පරිදි සාක්ෂාත් කර ගත නොහැකි වේ

මානව සම්පත් පැතිකඩ

6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්ත)**
ජ්‍යෙෂ්ඨ	43	27	16
තෘතීයික	3	3	0
ද්විතියික	66	55	11
ප්‍රාථමික	31	23	8

6.2. **ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න

විවිධ සංවර්ධන පාර්ශ්වකරුවන්ගෙන් විවිධ නියමයන් හා කොන්දේසි මත සහ අමාත්‍ය මණ්ඩලය, මහ බැංකුවේ මුදල් මණ්ඩලය, නීතිපති දෙපාර්තමේන්තුව සහ ජනාධිපති ලේකම් කාර්යාලය ආදියෙන් නිසි අනුමැතිය ඇතිව විදේශ සම්පත් ඒකරාශී කිරීම විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ කාර්යභාරය වේ. විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ කාර්යභාරය සාක්ශාත් කරගැනීම සඳහා සම්මුති සාකච්ඡා පැවැත්වීමේ කුසලතා, භාෂා කුසලතා සහ ආර්ථික විද්‍යාව, රාජ්‍ය ප්‍රතිපත්ති, රාජ්‍ය මූල්‍ය, සංඛ්‍යානය, ව්‍යාපෘති සැලසුම්කරණය සහ ක්‍රියාවට නැංවීම, ණය කළමණාකරණය සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණය ආදී විෂය ක්ෂේත්‍රයන්ගේ වැඩකිරීමට මනා දැනුමක් සහිත කාර්ය මණ්ඩලයක් අවශ්‍ය වේ. පුහුණුව ලත් නිලධාරීන් වාර්ෂික ස්ථාන මාරුවීම් ක්‍රමය හරහා වෙනත් ස්ථානවලට මාරු කරන අතර, එම පුරප්පාඩු වෙනත් ස්ථානවලින් මාරුවීම් ලැබ පැමිණෙන නිලධාරීන්ගෙන් පුරවනු ලැබේ. මෙලෙස වාර්ෂික ස්ථාන මාරුවීම් හරහා පැමිණෙන නිලධාරීන් අතුරින් අවශ්‍ය කෙරෙන කුසලතා සහ දැනුමෙන් සමන්විත නිලධාරීන් සොයා ගැනීම ඉතා අසීරු අතර, එම නිලධාරීන් පුහුණු කිරීමට දෙපාර්තමේන්තුවට අවම වශයෙන් වසර දෙකක්වත් ගතවේ. මෙය දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්යක්ෂමතාවයට බලපායි.

6.3. මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (රු.)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ ලබාගත් දැනුම*
			දේශීය	විදේශීය		
රාජ්‍ය අංශයේ ණය සංඛ්‍යාලේඛන	01	2024 ජනවාරි 15 – 19		20,909.61	විදේශයක	රාජ්‍ය අංශයේ ණය සංඛ්‍යාලේඛන පිළිබඳ දැනුම ලබා ගැනීම
ද්විතීයික වැඩසටහන - ලෝක බැංකුව	01	2024 ජනවාරි 04 – ජූලි 06		123,966.35	විදේශයක	දැනුම ලබාගන්න
දේශගුණික විපර්යාස පිළිබඳ සාර්ව ආර්ථික විද්‍යාව	01	2024 ජනවාරි 29 – පෙබරවාරි 08		8774.90	විදේශයක	දේශගුණික විපර්යාස පිළිබඳ සාර්ව ආර්ථික විද්‍යාව පිළිබඳ දැනුම ලබා ගැනීම
JICA දැනුම සහ-නිර්මාණ වැඩසටහන:	01	2024 පෙබරවාරි 15 – මාර්තු 08		132,311.03	විදේශයක	ජපානයේ WB සහ JICA අතර සහයෝගීතා වැඩසටහන පිළිබඳ දැනුම ලබා ගැනීම.
ඕස්ට්‍රේලියාව දේශගුණික මූල්‍ය සඳහා ප්‍රවේශ වීම පිළිබඳ කෙටි පාඨමාලාවක් ප්‍රදානය කරයි	01	2024 පෙබරවාරි 17 – මාර්තු 02		8011.81	විදේශයක	දේශගුණික මූල්‍යකරණයට ප්‍රවේශ වීම පිළිබඳ දැනුම ලබා ගන්න.
ණය ආශ්‍රිත මූල්‍ය අවදානම් තක්සේරු කිරීම සහ කළමනාකරණය කිරීම: රජයේ ඇපකර කෙරෙහි අවධානය යොමු කිරීම.	01	2024 අප්‍රේල් 08 – 12		15,347.21	විදේශයක	ණය ආශ්‍රිත මූල්‍ය අවදානම් තක්සේරු කිරීම සහ කළමනාකරණය කිරීම පිළිබඳ දැනුම ලබා ගැනීම: රජයේ ඇපකර කෙරෙහි අවධානය යොමු කිරීම.
දේශගුණික සංක්‍රාන්තිය සඳහා කලාපීය හවුල්කාරිත්වය ශක්තිමත් කිරීම පිළිබඳ වැඩමුළුව	02	2024 මාර්තු 26 - 27		53,126.76 කි	විදේශයක	දේශගුණික සංක්‍රාන්තිය සඳහා කලාපීය හවුල්කාරිත්වය ශක්තිමත් කිරීම පිළිබඳ දැනුම ලබා ගැනීම.

ශ්‍රී ලංකාවේ තරුණ රාජ්‍ය තාන්ත්‍රිකයින් පිළිබඳ සම්මන්ත්‍රණය	03	2024 අප්‍රේල් 16 - 29		344,274.54	විදේශයක	පාලන කටයුතු පිළිබඳ දැනුම ලබා ගන්න
චක් තීරයක් සහ මාවතක් සඳහා ගෝලීය ඩිජිටල් සහයෝගීතාවයේ නව රටාවක් ගොඩනැගීම පිළිබඳ සම්මන්ත්‍රණය	01	2024 අප්‍රේල් 19 - 25		68298.21	විදේශයක	උසස් තත්ත්වයේ ඩිජිටල් සේවයක් ඒකාබද්ධව ගොඩනැගීම සහ ගෝලීය ඩිජිටල් සහයෝගීතාවයේ නව රටාවක් ගොඩනැගීම පිළිබඳ දැනුම ලබා ගැනීම.
ස්ත්‍රීවාදී මූල්‍ය සංසදය: ආසියා සහ පැසිෆික් කලාපයේ ස්ත්‍රීවාදී මූල්‍ය පරිසර පද්ධතියක් සඳහා වන ක්‍රියාමාර්ග	01	2024 මැයි 07 - 08		11,749.19	විදේශයක	ආසියා පැසිෆික් කලාපයේ ස්ත්‍රීවාදී මූල්‍ය පරිසර පද්ධතිය පිළිබඳ දැනුම ලබා ගන්න.
තිරසාර, සාධාරණ, ආර්ථික පරිවර්තනය සහ සංවර්ධනය සඳහා කාර්මික හා මූල්‍ය උපාය මාර්ග පිළිබඳ වැඩමුළුව	01	2024 මැයි 13 - 16		110,278.54	විදේශයක	තිරසාර, සාධාරණ, ආර්ථික පරිවර්තනය සහ සංවර්ධනය සඳහා කාර්මික සහ මූල්‍ය උපාය මාර්ග පිළිබඳ දැනුම ලබා ගැනීම.
ඉන්දියානු තාක්ෂණික සහ ආර්ථික සහයෝගීතාව (ITEC) 2024/2025 යටතේ ශ්‍රී ලංකාවේ දූපත් සේවා නිලධාරීන් සඳහා වන පළමු වෘත්තීය මධ්‍ය පුහුණු වැඩසටහන	01	2024 මැයි 13 - 25		99,557.01	විදේශයක	කළමනාකරණය පිළිබඳ දැනුම ලබා ගන්න
මැලේසියානු තාක්ෂණික සහයෝගිතා වැඩසටහන (MTCP): ජාත්‍යන්තර සාකච්ඡා පාඨමාලාව	01	2024 ජූනි 04 - 13		85,043.78	විදේශයක	ජාත්‍යන්තර සාකච්ඡා පිළිබඳ දැනුම ලබා ගන්න
ජනතාව, ග්‍රහලෝකය, සමෘද්ධි සංසදය සහ ස්වභාවික ප්‍රාග්ධන සම්මන්ත්‍රණය	01	2024 ජූනි 02 - 08		46,395.20	විදේශයක	මිනිසුන්, ග්‍රහලෝකය, සමෘද්ධිය සහ ස්වභාවික ප්‍රාග්ධනය පිළිබඳ දැනුම ලබා ගන්න.
BRI රටවල් සඳහා මූල්‍යකරණය සහ මූල්‍ය සහයෝගීතා කළමනාකරණය පිළිබඳ සම්මන්ත්‍රණය	01	2024 ජූනි 14 - 27		116,545.27	විදේශයක	මූල්‍යකරණය සහ මූල්‍ය සහයෝගිතා කළමනාකරණය පිළිබඳ දැනුම ලබා ගැනීම

ඩිජිටල් යුගයේ පාලනය - ඕස්ට්‍රේලියාවේ කලාපීය කෙටි පාඨමාලාව සම්මාන ලබයි	02	2024 ජූනි 24 - ජූලි 05		234,666.26	විදේශයක	ඩිජිටල් යුගයේ පාලනය පිළිබඳ දැනුම ලබා ගන්න
ඉන්දියානු තාක්ෂණික සහ ආර්ථික සහයෝගීතාව (ITEC) 2024/2025 යටතේ ශ්‍රී ලංකාවේ දූපත් සේවා නිලධාරීන් සඳහා වන තුන්වන මධ්‍යම වෘත්තීය පුහුණු වැඩසටහන	01	2024 ජූලි 21 - අගෝස්තු 03		109,437.62	විදේශයක	තෙවන මධ්‍යම වෘත්තීය පුහුණු වැඩසටහන පිළිබඳ දැනුම ලබා ගැනීම
"රාජ්‍ය ණය කළමනාකරණය" පිළිබඳ NEDA හි ධාරිතා වර්ධන වැඩසටහන	02	2024 අගෝස්තු 25 - 31		107,964.08	විදේශයක	රාජ්‍ය ණය කළමනාකරණය පිළිබඳ දැනුම ලබා ගැනීම
ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳ සම්මන්ත්‍රණය 2024	01	2024 අගෝස්තු 22 - සැප්තැම්බර් 13		120,098.18	විදේශයක	ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳ දැනුම ලබා ගැනීම
ගෝලීය සංවර්ධන මූලපිරීම යටතේ දේශගුණික විපර්යාස සහ හරිත සංවර්ධනය ආමන්ත්‍රණය කිරීම පිළිබඳ සම්මන්ත්‍රණය	01	2024 සැප්තැම්බර් 03 - 16		115,521.76	විදේශයක	දේශගුණික විපර්යාස සහ හරිත සංවර්ධනය ආමන්ත්‍රණය කිරීම පිළිබඳ දැනුම ලබා ගන්න.
BRI හවුල්කාර රටවල් සඳහා මූල්‍ය උපාය මාර්ග පිළිබඳ සම්මන්ත්‍රණය	01	2024 සැප්තැම්බර් 01 - 09		69,313.06	විදේශයක	මූල්‍ය උපාය මාර්ග පිළිබඳ දැනුම ලබා ගන්න
ගෝලීය සංවර්ධන මූලපිරීම යටතේ ඩිජිටල් ආර්ථික පාලනය පිළිබඳ සම්මන්ත්‍රණය	02	2024 සැප්තැම්බර් 12 - 25		230,581.44	විදේශයක	ඩිජිටල් ආර්ථික පාලනය පිළිබඳ දැනුම ලබා ගන්න
චීනය සඳහා පාලන හැකියාව පිළිබඳ සම්මන්ත්‍රණය - තීරය සහ මාවත රටවල්	01	2024 සැප්තැම්බර් 17 - 30		115,906.83	විදේශයක	පාලන හැකියාව පිළිබඳ දැනුම ලබා ගැනීම
මධ්‍ය කාලීන ණය කළමනාකරණ උපාය මාර්ගය සංවර්ධනය කිරීම	01	2024 සැප්තැම්බර් 23 - 27		12,186.72	විදේශයක	මධ්‍ය කාලීන ණය කළමනාකරණ උපාය මාර්ග සංවර්ධනය පිළිබඳ දැනුම ලබා ගැනීම.

ගෝලීය සංවර්ධන ප්‍රවර්ධන මධ්‍යස්ථාන ජාලයේ සාමාජිකයින් සඳහා වූ සම්මන්ත්‍රණය	01	2024 ඔක්තෝබර් 12 - 21		90,083.68	විදේශයක	ගෝලීය සංවර්ධන ප්‍රවර්ධන මධ්‍යස්ථාන ජාලය පිළිබඳ දැනුම ලබා ගන්න
සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා දිවයිනේ දේශගුණික විපර්යාස සහ ආර්ථික සංවර්ධනය පිළිබඳ සම්මන්ත්‍රණය	01	2024 ඔක්තෝබර් 15 - 28		112,546.24	විදේශයක	සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා දිවයිනේ දේශගුණික විපර්යාස සහ ආර්ථික සංවර්ධනය පිළිබඳ දැනුම ලබා ගැනීම
ආසියාව සහ පැසිෆික් කලාපය පුරා AI බලයෙන් ක්‍රියාත්මක වන සංවර්ධනය සඳහා පාඨමාලාව ප්‍රස්ථාරගත කිරීම.	01	2024 නොවැම්බර් 04 - 08		45,058.70	විදේශයක	ආසියාව සහ පැසිෆික් කලාපය පුරා AI බලයෙන් ක්‍රියාත්මක වන සංවර්ධනය පිළිබඳ දැනුම ලබා ගන්න.
තායිලන්තයේ NEDA විසින් පිරිනමනු ලබන රාජ්‍ය ණය කළමනාකරණ ධාරිතා ගොඩනැගීමේ වැඩසටහන	09	2024 නොවැම්බර් 10 - 15		442,561.30	විදේශයක	රාජ්‍ය ණය කළමනාකරණය පිළිබඳ දැනුම ලබා ගැනීම
තීරයක් සහ මාවතක් මූලපිරීමේ කුසලතා සංවර්ධන වැඩසටහනට ආරාධනාව	01	2024 දෙසැම්බර් 01 - 07		56,349.70	විදේශයක	තීරයක් සහ මාවතක් මූලපිරීමේ කුසලතා සංවර්ධන වැඩසටහන පිළිබඳ දැනුම ලබා ගන්න.
ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය	01	2024 දෙසැම්බර් 08 - 13		-	විදේශයක	ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව පිළිබඳ දැනුම ලබා ගන්න
රථවාහන නීති පිළිබඳව රියදුරන් දැනුවත් කිරීමේ වැඩසටහනක්	09	2024 ජනවාරි 11 සහ 30	නොමිලේ	දේශීය		රථවාහන නීති පිළිබඳ දැනුම ලබා ගන්න
ව්‍යාපාර ඉංග්‍රීසි ඩිප්ලෝමාව	02	පෙබරවාරි 11 සිට වසරක් සපිරේ	130,000	දේශීය		ව්‍යාපාර ඉංග්‍රීසි දැනුම ලබා ගන්න
වෘත්තීය ඉංග්‍රීසි ඩිප්ලෝමාව	01	මාර්තු 10 සිට වසරක් සපිරේ	92,000	දේශීය		වෘත්තීය ඉංග්‍රීසි දැනුම ලබා ගන්න
ටෝස්ට්මාස්ටර්ස් ඉන්ටර්නැෂනල් සමඟ කථන ශිල්ප වැඩසටහන 2024	02	2024 මාර්තු 19 (දින 10 - එක් නිලධාරියෙකු)	70,000	දේශීය		ටෝස්ට්මාස්ටර්ස් ඉන්ටර්නැෂනල් සමඟින් කථන ශිල්ප වැඩසටහනෙන්

		2024 ඔක්තෝබර් 23 (දින 10 - එක් නිලධාරියෙකු)				කථන කුසලතා ලබා ගන්න.
ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ තොරතුරු පද්ධතිය පිළිබඳ පුහුණුව - ITMIS	02	2024 ජූලි 23, 24 සහ 25	නොමිලේ	දේශීය		ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ තොරතුරු පද්ධතිය - ITMIS පිළිබඳ දැනුම ලබා ගැනීම.
වාර්තා ලිවීමේ කුසලතා	01	2024 අගෝස්තු සහ සැප්තැම්බර් (දින 02)	14,000	දේශීය		වාර්තා ලිවීම පිළිබඳ දැනුම ලබා ගන්න
රාජ්‍ය ප්‍රසම්පාදන හා වත්කම් කළමනාකරණය පිළිබඳ උසස් සහතිකය	01	2024 නොවැම්බර් 19 (දින 10)	30,000	දේශීය		රාජ්‍ය ප්‍රසම්පාදන හා වත්කම් කළමනාකරණය පිළිබඳ දැනුම ලබා ගැනීම
ජාතික තොරතුරු තාක්ෂණ සමුළුව 2024 (NITC)	02	2024 නොවැම්බර් 24 - 26	100,000	දේශීය		තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම ලබා ගන්න

අනුකූලතා වාර්තාව

7.1. අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාළ නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.6	වෙනත්	අදාළ නොවේ		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල නොවේ	ඒ වනවිට අයවැය ඇස්තමේන්තුව අනුමතවී නොමැත.	
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		

4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ			
5	**විගණන විමසුම්**				
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ			
6	**අභ්‍යන්තර විගණනය**				
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ			
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ			
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ			
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ			
7	**විගණන හා කළමනාකරණ කමිටු**				
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ			
8	**වත්කම් කළමනාකරණය**				
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ			
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 1.3 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම	අනුකූල වේ			

8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අදාළ නොවේ		

10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නෙඉක්මවන පරිදි බැරකම්වලට චලඹීම)	අනුකූල වේ		
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ	වැන්දඹු විශ්‍රාම වැටුපේ අයිතිය පිළිබඳ ගැටලුවක් හේතුවෙන් විශ්‍රාම වැටුපක් ගෙවීමට ඉතිරිව ඇත. එබැවින් නීතිමය කටයුතු අවසන් වූ පසු ඉතිරි මුදල පියවන බව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව දන්වා ඇත. සේවකයාගේ රාජකාරිය අත්හිටවීම හේතුවෙන් තවත් විශ්‍රාම වැටුපක් ගෙවීමට ඉතිරිව ඇත. ලිඛිතව ගෙවීමට උපදෙස් දී ඇත	
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අදාළ නොවේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

14	**අග්‍රිම ගිණුම**				
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ			
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ			
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ			
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ			
15	**ආදායම් ගිණුම**				
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අදාළ නොවේ			
15.2	රැස් කර තිබූ ආදයම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අදාළ නොවේ			
15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අදාළ නොවේ			
16	**මානව සම්පත් කළමනාකරණය**				
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ			
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම	අනුකූල වේ			
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ			
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**				
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ			

17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පළ කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		
18.2	චම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම.	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල නොවේ	රජයේ පුහුණු ආයතන විසින් ලබා දෙනු ලබන්නේ සීමිත පුහුණු අවස්ථාවන් ප්‍රමාණයක් පමණි.	
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		